**කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය සහ සමූහය - 2023**
**-----------------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ ("මණ්ඩලය") සහ එහි ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනාක්‍රමය සහ ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනාක්‍රමවල ("සමූහය") 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මණ්ඩලයේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ, 1999 අංක 20 දරන කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**සමූහය**

**ව්‍යාවනය කළ මතය**

සමූහයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. සමූහයේ මතය ව්‍යාවනය සඳහා පදනම කොටසේ (1.2) සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මා හට නොහැකි විය.

**කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය**

**තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 1.5.1 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 සමූහයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව ව්‍යාවනය කළ මතය සඳහා පදනම

මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මෙම වාර්තාවේ 1.5.1 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

සමූහය තුළ ඇති ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මෙම වාර්තාවේ 1.5.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

සමූහය තුළ ඇති ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මෙම වාර්තාවේ 1.5.3 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ව්‍යාවනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය සහ සමූහය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මණ්ඩලය සහ සමූහය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ සහ සමූහයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ සහ සමූහයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ සහ සමූහයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ සහ සමූහයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල මණ්ඩලයේ සහ සමූහයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ සහ සමූහයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මණ්ඩලය සහ සමූහය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන

#### 1.5.1.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙළ කිරීමේදී ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 07හි 04 වන ඡේදයට පටහැනිව, | | |
| (i) | සම්බන්ධිත පාර්ශව ගනුදෙනු ශේෂ අතර වෙනස රු.54,053,519 ක් ලැබිය යුතු ගිණුම් ශේෂ තුළ ගැලපීම සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රම සඳහා පවත්වාගෙන යන ජංගම ගිණුම් වල සත්‍ය මුදල් ගලා ඒම රු.206,225,000 ක් සහ සත්‍ය මුදල් ගලා යාම රු.205,665,309 ක් මෙහෙයුම් මුදල් ප්‍රවාහය තුළ හඳුනා ගෙන නොතිබීම නිසා මෙහෙයුම් මුදල් ප්‍රවාහය රු.54,613,210 කින් ඌණගණනය වී තිබුණි. | ඉදිරිපත් කිරීමේදී ඇති වී ඇති දෝෂ ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශයන් පිළියෙල කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ii) මුදලින් ගෙවන ලද සේවක වෛද්‍ය රක්ෂණ ගාස්තු ගෙවීම රු.2,181,826 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුළ ඉදිරිපත් නොකිරීම හේතුවෙන් එම වටිනාකමෙන් මෙහෙයුම් මුදල් ප්‍රවාහය අධි ගණනය වී තිබුණි.<br><br>(iii) ගොවීන්ගේ මරණ පාරිතෝෂික අරමුදල් ගිණුමෙහි සත්‍ය මුදල් ප්‍රවාහය රු.49,281,460 ක් මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් වූ මුදල් ප්‍රවාහයක් ලෙස නොදක්වා ගොවීන්ගේ මරණ පාරිතෝෂික අරමුදල් ගිණුමෙහි ශේෂ වෙනස රු.133,219,275 ක් ආයෝජන ක්‍රියාකාකම්වලින් වූ මුදල් ප්‍රවාහයක් ලෙස වාර්තා කිරීම හේතුවෙන් රු.49,281,460 කින් මෙහෙයුම් මුදල් ප්‍රවාහය අවතක්සේරු වී රු.133,219,275 කින් ආයෝජන මුදල් ප්‍රවාහය අධි ගණනය වී තිබුණි.<br><br>(iv) ගොවි විශ්‍රාම වැටුප් යොජනාක්‍රමයෙහි ණය ගිණුමෙහි රු.20,000,000 ක ණය පියවීම ආයෝජන මුදල් ගලා ඒමක් ලෙස සටහන් නොකිරීම නිසා අයෝජන මුදල් ප්‍රවාහය එම වටිනාකමින් ඌණ ගණනය වී තිබුණි.<br><br>(v) සේවක වෛද්‍ය රක්ෂණ අරමුදලට අදාළව රු.2,430,248 ක සහ ගොවීන්ගේ මරණ පාරිතෝෂික අරමුදලට අදාළව රු.6,326,428 ක ලැබිය යුතු ආයෝජන පොලී ආදායම් ගිණුම්වල ශේෂ වෙනස ආයෝජන ක්‍රියාකාරකම් මත වූ මුදල් ප්‍රවාහය ලෙස සැලකීම නිසා අයෝජන මුදල් ප්‍රවාහය රු. 8,756,676 කින් ඌණ ගණනය වී තිබුණි.<br><br>(vi) සේවක වෛද්‍ය රක්ෂණ අරමුදල් ගිණුමේ ශේෂ වෙනස රු.8,500,488 ක වැඩි වීම ආයෝජන මුදල් ප්‍රවාහය තුළ වාර්තා කිරීම නිසා ආයෝජන මුදල් ප්‍රවාහය එම ප්‍රමාණයෙන් අධි ගණනය වී තිබුණි.<br><br>(vii) සේවක වෛද්‍ය රක්ෂණ අරමුදලේ ආයෝජන මත ලද පොලිය රු.2,972,367 ක් ආයෝජන මුදල් ප්‍රවාහය තුළ ඉදිරිපත් නොකිරීම හේතුවෙන් එම ප්‍රමාණයෙන් ආයෝජන මුදල් ප්‍රවාහය ඌණ ගණනය වී තිබුණි. | ඉදිරිපත් කිරිමේදී ඇති වී ඇති දෝෂ ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශයන් පිළියෙල කළ යුතුය. |

## 1.5.1.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පරීක්ෂා කරන ලද දිස්ත්‍රික් කාර්යාල 14 ක 2023 මාර්තු මස තෙවන පාර්ශව රක්ෂණ ආදායම ලෙස මූල්‍ය ප්‍රකාශන අනුව හඳුනාගෙන ඇති අගය සහ දිස්ත්‍රික් කාර්යාලවල පරිගණක ගත දත්ත අනුව ආදායම අතර රු.8,119,818 ක වෙනසක් නිරීක්ෂණය විය. | ඇතැම් නියෝජිතයින් තැන්පතු රිසිට්පත් සහ තාවකාලික ආවරණ පත්‍ර ඊළඟ මාසයේ පළමු හෝ දෙවන සතිය තුළ කාර්යාලයට ලබාදීම නිසා අදාළ මාසයේ තැන්පතු පිළිබඳව දිස්ත්‍රික් කාර්යාල යාවත්කාලීන නොවේ. එහෙත් මුදල් අංශය මඟින් එම මුදල් තැන්පත් කළ බැංකුව අනුව එක් එක් දිස්ත්‍රික්කයෙන් ලද ආදායම යාවත්කාලීන කෙරේ. ඒ අනුව, අදාළ දිස්ත්‍රික් කාර්යාලයන්ද ඒ සමඟ යාවත්කාලීන වන අතර, මුදල් අංශය මඟින් සෑම මසක් අවසානයේ එක් එක් දිස්ත්‍රික්කයන් ඉපයූ ආදායම දක්වන අතර, ඒ අනුව කොමිස් මුදල් ගණනය කිරීම සිදුවේ. | කාලච්ඡේදයට අදාළ ආදායම නිවැරදිව ගිණුම්ගත කළ යුතුයි. |
| (ආ) | 2018 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා වගාහානි රක්ෂණ වන්දි ගෙවීම සඳහා මහා භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු ලෙස මණ්ඩලයේ අවසන් ගිණුම් තුළ දක්වා තිබුණු රු.4,249,619,152 ක ලැබිය යුතු ආදායම 2023 වර්ෂයේදී කපා හැර තිබුණි. 1999 අංක 20 දරන කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩල පනත අනුව මෙහෙයුම් ආදායමින් සියයට 5 ක් ගොවිජන රක්ෂණ අරමුදලට මාරුකරන බැවින් ඉහත මුදලට අදාළව එලෙස මෙහෙයුම් අදායමින් මාරුකළ රු.212,480,957 ක මුදල ගොවිජන රක්ෂණ අරමුදලින් ඉවත් කර සමුච්චිත අරමුදලට ගලපා නොතිබුණි. | මේ සඳහා කැබිනට් මණ්ඩල තීරණය අනුව කෘෂි කාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය වෙත රජයේ භාණ්ඩාගාරය විසින් මුදල් ලබා දීමට කටයුතු කරන ලද අතර, භාණ්ඩාගාරය විසින් මණ්ඩලයට ලැබිය යුතු මුදල්, මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුළ ලැබිය යුතු මුදල් ලෙස ගිණුම් ගත කරන ලදී. මෙම මුදල් මණ්ඩලය වෙත ලබා දීම සඳහා වරින් වර අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාදී තිබුණද, අදාළ මුදල් මණ්ඩලය වෙත නොලැබුණි. ඒ අනුව මණ්ඩලය වෙත ලැබීමට නියමිතව තිබූ මුදල් භාණ්ඩාගාර අනුමැතිය මත මූල්‍ය ප්‍රකාශන වලින් කපා හැරීමට කටයුතු කරන ලදී. | අරමුදල් සඳහා මාරුකිරීමට පදනම් කරගත් ආදායම කපා හැරීමේදී, ඒ මත පදනම්ව මෙහෙයුම් ආදායමින් ගොවිජන රක්ෂණ අරමුදලට මාරුකිරීම් ආපසු ගැලපිය යුතුය. |
| (ඇ) | මහියංගනය, ඇඹිලිපිටිය සහ අනුරාධපුරය යන නගරවල පිහිටි මණ්ඩලයට අයත් නිල නිවාස 3 පිහිටි පර්චස් 76.6 ක් වූ ඉඩම් වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි. | මහියංගනය, ඇඹිලිපිටිය හා අනුරාධපුරය යන නිල නිවාසයන්හි ඉඩම්වල වටිනාකම හා ඇඹිලිපිටිය නිල නිවාසයේ වටිනාකම තක්සේරු කර ගැනීම සඳහා අවශ්‍ය කටයුතු ආරම්භ කර ඇත. | වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල සටහන් කළ යුතුය. |

### 1.5.2 ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය මූල්‍ය ප්‍රකාශන

#### 1.5.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 7 හි 4 වන ඡේදයට පටහැනිව පෙර වර්ෂ ගැලපුම් රු.98,000 ක් අඩුකිරීමක් ද මරණ පාරිතෝෂික අරමුදල සඳහා වෙන් කළ රු.1,746,720 ක මුදල එකතු කළ යුතු වුවත් අඩුකර දැක්වීමත්, මරණ පාරිතෝෂික අරමුදලින් කළ ගෙවීම් රු.173,000 ක් අනාවරණය නොකිරීමත්, ගෙවිය යුතු මරණ පාරිතෝෂික ශේෂයෙහි වෙනස වූ රු.8,000 ක් කාරක ප්‍රාග්ධනය වෙනස්වීම් තුළ එකතු කිරීම් ලෙස අන්තර්ගත කිරීම හේතුවෙන් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් රු.3,410,440 කින් අවතක්සේරු වී තිබුණි. මරණ පාරිතෝෂික අරමුදල් ගිණුමේ ශේෂයෙහි වෙනස හා වෙන්කිරීම්වල එකතුව වූ රු.3,410,440 ක මුදල ආයෝජන ක්‍රියාකාරකම්වලට එකතු කිරීම හේතුවෙන් ආයෝජන මුදල් ප්‍රවාහය අධි ගණනය වී තිබුණි. | පෙර වර්ෂයට අදාළ ගැලපීමක් ලෙස රු.98,000 ක මුදලක් මෙම වර්ෂයේදී නිවැරදි කිරීම සිදු කරන ලද බැවින් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේද ඇතුළත් කර ඇත. මෙහෙයුම් ක්‍රියාකාරම් සඳහා කරන ලද ගැලපීම හා ආයෝජන ක්‍රියාකාරම් තුළින් සිදුකර ඇති ගැලපීම් නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශයන් පිළියෙල කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 37 හි 59 වන ඡේදය ප්‍රකාරව රු.5,532,349,026 ක් වූ විශ්‍රාම වැටුප් වගකීම සඳහා වූ ආයු ගණක තක්සේරුව 2007 වර්ෂයෙන් පසුව සිදු කර නොතිබුණි. | මණ්ඩලයේ අලුතින් ආරම්භ කර ඇති අනෙකුත් සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රම සමඟ ආයුගණක තක්සේරු සිදුකිරීමට කටයුතු කරනු ලබන අතර, එය 2024 වර්ෂයේ අයවැය ලේඛනය තුළ ඇතුළත් කර ඇති අතර මේ වන විට අදාළ කටයුතු සිදු කර ගෙන යන බව පෙන්වා දෙමි. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව ආයුගණක තක්සේරුව සිදු කළ යුතුය. |

#### 1.5.2.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් කාර්ය මණ්ඩලයක් අනුමත කර නොතිබියදී අදාළ කාර්ය සඳහා සෘජුවම සම්බන්ධ නොමැති නිලධාරීන් දෙදෙනෙකු සඳහා ගෙවූ එකතුව රු.1,332,218 ක් වූ වැටුප් වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | යෝජනා ක්‍රමයේ රාජකාරී ඉටු කිරීමට බඳවාගෙන ඇති මෙම නිලධාරීන් වර්තමානයේ වෙනත් රාජකාරි කටයුතු සිදු කරනු ලබයි. යෝජනා ක්‍රමයට අයත් රාජකාරි චක්‍රාකාරයෙන් වෙනත් නිලධාරීන්ද සිදු කරනු ලබන නිසා මෙම නිලධාරීන්ගේ වැටුප යෝජනා ක්‍රමයට ඇතුළත් කර ඇත. ප්‍රමාණවත් සේවක සංඛ්‍යාවක් බඳවා ගැනීමෙන් පසු යෝජනා ක්‍රමයට අදාළ සේවකයින්ගේ වැටුප් යෝජනා ක්‍රමයට අන්තර්ග්‍රහණය කිරීමට නියමිතය. | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් කාර්ය මණ්ඩලය අනුමත කර බඳවාගත යුතුය. |

### 1.5.2.3 අරමුදලේ අඛණ්ඩ පැවැත්ම

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | විශ්‍රාම වැටුප් වගකීම රු.5,532,349,026 ක් වුවද එදිනට ආයෝජන වටිනාකම රු.793,308,692 ක් වූයෙන් මෙම බැඳීම් පියවීමට ප්‍රමාණවත් ආයෝජනයක් සිදුකර නොතිබුණි. | පිළිතුරු ලබාදී නොමැත | විශ්‍රාම වැටුප් වගකීම පියවීමට ප්‍රමාණවත් ආයෝජනයක් සිදුකළ යුතුය. |
| (ආ) | යෝජනාක්‍රමයේ මුළු ශුද්ධ වත්කම් දිගින් දිගටම සෘණ අගයක් වීම මත යෝජනාක්‍රමයේ මුළු වත්කම් උපලබ්ධි කිරීමෙන් මුළු වගකීම් පියවීමට නොහැකි වීමත් මත යෝජනාක්‍රමයේ අඛණ්ඩ පැවැත්ම මතභේදාත්මක වේ. | මෙම යෝජනා ක්‍රමය ස්වයං මූල්‍ය පදනමකින් ක්‍රියාත්මක නොවන අතර, වාරික තීරණය කිරීමේදී රාජ්‍ය සහනාධාරයට අන්තර්ග්‍රහණය කිරීම නිසා මෙම තත්ත්වය උද්ගත වී ඇත. ඒ අනුව වාර්ෂිකව ගෙවිය යුතු විශ්‍රාම වැටුප් වගකීම ඉහළ යනු ලබන අතර එම නිසා ශුද්ධ වත්කම් අගයද අඩු වේ. එම හේතු නිසා මෙම යෝජනා ක්‍රමය සඳහා නව බඳවා ගැනීම් සිදු කිරීම ප්‍රවර්ධනය නොකරයි. | යෝජනාක්‍රමයේ මුළු ශුද්ධ වත්කම් දිගින් දිගටම සෘණ අගයක් වීම වළක්වා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 1.5.3 ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය

### 1.5.3.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 01 හි 88 ඡේදයට පටහැනිව සමාලෝචිත වර්ෂයේ දී ගොවීන්ගෙන් ලැබුණු වාරික ආදායම හා ආයෝජන පොලිය ඇතුළුව ලැබුණු රු.133,810,611 ක මුදල කාලපරිච්ඡේදයේ ආදායමක් ලෙස ගිණුම්ගත නොකර සමුච්චිත අරමුදලට ගලපා තිබුණු බැවින් එම ප්‍රමාණයෙන් ලාභය අඩු වී තිබුණි. | මණ්ඩලයේ ගොවි විශ්‍රාම වැටුප් දායකයින්ගෙන් අය කරගන්නා වාර මුදල් දායකයින්ගේ වයස අවුරුදු 60 සම්පූර්ණ වමේදි ඔවුන්ට ප්‍රතිලාභ ලෙස ගෙවිය යුතු බැවින්, අය කරන ලද වාර මුදල් සහ ඊට අදාළ පොලී මුදලේ එකතුව මණ්ඩලයේ අරමුදල් ගිණුමට ගැලපීම සිදු කර ඒ තුළින් අනාගතයේදී ගෙවිය යුතු වගකීම් සඳහා අරමුදල ශක්තිමත් කිරීම අපේක්ෂා කෙරේ. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිය ප්‍රකාරව මුදල් අයවූ කාලපරිච්ඡේදයේ ආදායමක් ලෙස හඳුනාගත යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 37හි 59 වන ඡේදය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය අවසානයට රු.86,898,445,376 ක විශ්‍රාම වැටුප් වගකීම සඳහා වූ ආයුගණක තක්සේරුව කර නොතිබූ බැවින් නිරවද්‍යතාව තහවුරු නොවීය. | ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ හා මණ්ඩලීය අනෙකුත් යෝජනා ක්‍රම සඳහා 2024 අයවැය අනුව ජීව ගණක තක්සේරු ලබා ගැනීම සඳහා මෙම වසරේදී කටයුතු ආරම්භ කර ඇත . | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව ආයු ගණක තක්සේරුව සිදු කළ යුතුය. |

#### 1.5.3.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මණ්ඩලය විසින් යෝජනාක්‍රමයට අදාළව ගෙවූ රු.10,585,145 ක මුදල, මුදල් ගලායාමක් ලෙසද රු.3,046,341,760 ක් වූ පෙර වර්ෂ ගැලපීම් කාරක ප්‍රාග්ධනයේ මුදල් ගලා ඒමක් ලෙස ද මණ්ඩලය වෙනුවෙන් පවත්වා ගෙන තිබූ ජංගම ගිණුමේ රු.470,320 ක වෙනස දෙවරක් ද වශයෙන් මුදල් ප්‍රවාහයට වැරදි සහගත ලෙස ගළපා තිබුණි. තව ද අලුතින් අරමුදල සඳහා දායක වූ ගොවීන්ගෙන් ලද රු.20,730,787 ක ලැබූ මුදල ද මුදල් ගලා ඒමක් ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශයට ගළපා නොතිබුණ අතර මුදලින් පියවන ලද රු.20,000,000 ක ණය වාරිකය මුදල් ප්‍රවාහය තුළ මුදල් ගලා යාමක් ලෙස සටහන් කර ද නොතිබුණි. | ගොවි විශ්‍රාම වැටුප් ක්‍රමයට අදාළව ගෙවනු ලබන රු.10,585,145 ක පාරිතෝෂිත මුදල වේ. කාරක ප්‍රාග්ධනය වෙනස්කම් වලින් ගැලපීම් සිදුවන නිසා මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයට මේ වන විටත් ගැලපීම් සිදු වී ඇත. | මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මුදල් ගලා ඒම් සහ ගලායාම් නිවැරදිව සටහන් කළ යුතුය. |

#### 1.5.3.3 අරමුදලේ අඛණ්ඩ පැවැත්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| යෝජනාක්‍රමයේ මුළු වත්කම් රු.2,202,748,150 ක් සහ මුළු වගකීම් රු.89,457,327,488 ක් වූයෙන් වත්කම් ඉක්මවූ වගකීම් රු.87,254,579,339 ක් ද, මුළු ජංගම වත්කම් රු.1,092,503,529 ක් සහ මුළු ජංගම වගකීම් රු.2,527,354,554 ක් වූයෙන් ජංගම වත්කම් ඉක්මවූ ජංගම වගකීම් රු.1,434,851,025 ක් ද වන අතර භාණ්ඩාගාරයේ දායකත්වයක් නොමැතිව යෝජනා ක්‍රමය පවත්වාගෙන යා නොහැකි තත්ත්වයක පවතින නිසා යෝජනාක්‍රමයේ අඛණ්ඩ පැවැත්ම ගැටළු සහගතවේ. | ගොවි විශ්‍රාම වැටුප් වගකීම වාර්ෂිකව වැඩිවන අතර, යෝජනා ක්‍රමය තුළ ආයෝජන නොමැතිකමත් මෙම යෝජනා ක්‍රමයේ ප්‍රතිලාභ වාරික මුදල් වැඩිකිරීමකින් තොරව අවස්ථා කිහිපයකදී රාජ්‍ය ප්‍රතිපත්ති නිසා වැඩිකිරීම හේතුවෙන් මෙම තත්ත්වය උද්ගත වී ඇති අතර, සෑම වර්ෂයකදීම රජයේ අයවැය මඟින් මුදල් වෙන්කර ගොවි විශ්‍රාම වැටුප් ගෙවීම සිදුකරගෙන යනු ලබයි. | යෝජනා ක්‍රමය සක්‍රීය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

#### 1.5.3.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගොවීන්ගේ නිවැරදි ජීව දත්ත තොරතුරු යාවත්කාලීන කිරීමේ ක්‍රමවේදයක් නොමැති වීම හේතුවෙන් මියගිය සහ වෙනත් හේතුන් මත හිමිකම් නොපාන ගොවීන්ගේ විශ්‍රාම වැටුප දිගින් දිගටම තැපැල් දෙපාර්තමේන්තුව | ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට අදාළව ප්‍රධාන කාර්යාලය වෙත ලැබෙන සියලු ලේඛන පරීක්ෂා කර බලා නිසි පරිදි ප්‍රධාන කාර්යාලයේ යම් ස්ථානයක හෝ | හිමිකම් නොපෑ මුදල් පිළිබඳ තොරතුරු යාවත්කාලීන කර භාණ්ඩාගාරයට ප්‍රේෂණය කළ යුතුය. |

| | |
|---|---|
| වෙත ප්‍රේෂණය කර තිබුණි. මේ හේතුවෙන් 2023 වර්ෂයේ දී ගොවීන් විසින් භාර නොගැනීම නිසා තැපැල් දෙපාර්තමේන්තුව විසින් ආපසු එවූ විශ්‍රාම වැටුප රු.259,373,191 ක් වූ අතර සමාලෝචිත වසර අවසානයට එම දෙපාර්තමේන්තුවෙන් ලැබිය යුතු ශේෂය රු.81,000,602 ක් විය. විශ්‍රාම වැටුප් ලබා නොගත් ගොවීන් පිළිබඳ විස්තර නඩත්තු කර නොතිබීම නිසා වර්ෂ අවසාන ශේෂයෙහි සහ ලද මුදලෙහි නිරවද්‍යතාව තහවුරු නොවීය. | ලේඛනාගාරයේ ගබඩා කිරීමටත් එම ලේඛනවල තොරතුරු සහිත පරිගණක දත්ත පද්ධතිය යාවත්කාලීන කිරීම සිදු කෙරෙමින් පවතින බවද වැඩිදුරටත් දන්වා සිටිමි. දිසා ගණකාධිකාරීවරුන් විසින් නොගෙවූ විශ්‍රාම වැටුප් ලේඛන අන්තර්ජාලය ඔස්සේ අප වෙත ලබා දෙනු ලබන අතර එය විධිමත්ව පවත්වා ගැනීමට කටයුතු කරනු ලැබේ. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| | මු.රෙ 381 | මණ්ඩලයේ බැංකු ගිණුම් 45 ක්ද ඇතුළු සමූහයේ බැංකු ගිණුම් 57 ක් භාණ්ඩාගාර අනුමැතිය නොමැතිව ආරම්භ කර පවත්වාගෙන යනු ලබයි. | මණ්ඩලය විසින් රාජකාරි ගිණුම් ආරම්භ කිරීමේදී අධ්‍යක්ෂ මණ්ඩලය වෙත අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් යොමු කර අදාළ අනුමැතිය ලබා ගනු ලබයි. | බැංකු ගිණුම් සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබාගත යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | | | |
| | (i) II වැනි පරිච්ඡේදයේ 13.4 වගන්තිය | පුරප්පාඩු වී තිබෙන තනතුරක වැඩ බැලීම සඳහා එම තනතුර දැරීමට සෑම අතින්ම පූර්ණ සුදුසුකම් ඇති නිලධාරියකු පත් කළ යුතු වුවත්, සුදුසුකම් නොමැති නිලධාරීන් 09 දෙනෙකු සංවර්ධන නිලධාරී තනතුර සඳහාද එක් නිලධාරියෙකු සැපයුම් නිලධාරී තනතුර සඳහා පත්කර තිබුණු අතර මාස 08 සිට අවුරුදු 06 දක්වා කාලයක් දිගින් දිගටම වැඩ බැලීමේ කාලය දීර්ඝ කරමින් සේවයේ නිරතව ඇති බව නිරීක්ෂණය විය. | මණ්ඩලයේ පුරප්පාඩුව පැවති තනතුරු සම්පූර්ණ කිරීමට නොහැකි වීම නිසා වැඩ බැලීමේ තනතුරු මඟින් දීප ව්‍යාප්තව සිටින ගොවි ජනතාව වෙනුවෙන් රාජකාරී සහ වගකීම් ඉටු කිරීම සඳහා ක්‍රියාත්මක කරනු ලබන සේවාවන් අඛණ්ඩව පවත්වා ගැනීමට කටයුතු කරන ලදී. ඉදිරියේදී මෙම තත්ත්වය නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | වැඩ බැලීම සඳහා එම තනතුර දැරීමට සෑම අතින්ම පූර්ණ සුදුසුකම් ඇති නිලධාරියකු පත් කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | (ii) XII වැනි පරිච්ඡේදයෙහි 7.5 වගන්තිය | විදේශීයව ගත කරන නිවාඩු සමඟ හිලව් නිවාඩු ලබා ගත නොහැකි නමුත් මණ්ඩලයේ හිටපු අධ්‍යක්ෂ ජනරාල් විසින්, 2023 සැප්තැම්බර් 10 දින සිට 2023 ඔක්තෝබර් 10 දින දක්වා දින 31 ක කාලයක් සඳහා විදේශීයව ගත කිරීමට හිලව් නිවාඩු ලබාගෙන තිබුණි. | මණ්ඩලීය නිලධාරීන්ගේ නිවාඩු සම්බන්ධව කටයුතු කිරීමේදී වරින් වර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද චක්‍රලේඛ හා උපදෙස් ලිපි අනුව නිවාඩු ගණනය කිරීම සිදුකරනු ලබන අතර ආයතන සංග්‍රහයේ ඇතුළත් සියළුම වගන්ති හා කොන්දේසි ඒ ආකාරයෙන්ම මණ්ඩලයේ නිලධාරීන්ගේ නිවාඩු සඳහා අදාළ කර නොගනී. ඒ අනුව අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (පාලන II) විසින් අධ්‍යක්ෂ ජනරාල්ගේ මෙරටින් ගත කරන ලද කාලය සඳහා නිවාඩු අනුමත කර ඇත. | ආයතන සංග්‍රහය විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |
| (ඇ) | කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩල කළමනාකරණ සේවා ගණයෙහි තනතුරු සඳහා වූ බඳවාගැනීමේ පරිපාටිය | | | |
| | (i) 4.3.1(අ) උප වගන්තිය | රක්ෂණ අංශයේ සහකාර අධ්‍යක්ෂ තනතුර සඳහා රාජ්‍ය අංශයේ/ සංස්ථා/ මණ්ඩල හෝ පිළිගත් ආයතනයක වසර 03 ක රක්ෂණ කටයුතු පිළිබඳ පළපුරුද්ද ඇති නිලධාරියෙකු බඳවාගත යුතු වුවත්, එයට පටහැනිව වසර 03 ක ක්ෂේත්‍ර හා පරිපාලන කටයුතු පිළිබඳ පළපුරුද්ද ඇති නිලධාරියෙකු බඳවාගෙන තිබුණි. | බඳවා ගැනිමේ පරිපාටිය අනුව එක් එක් අංශය සඳහා නම් කොට ඇති සහකාර අධ්‍යක්ෂවරුන් ප්‍රමාණවත් පරිදි බඳවා ගැනීමට අනුමැතිය නොලැබීම හා පුරප්පාඩු වූ තනතුරු සඳහා සුදුසුකම් සහිත අයදුම්කරුවන් ඉදිරිපත් නොවීය . බඳවාගන්නා ලද අයදුම්කරුවන්ගේ සුදුසුකම් හා අදාළ අංශවල සේවය කිරීමට ඔවුන් සතුව පැවති විෂයානුබද්ධ දැනුම පරීක්ෂාකර කෙටි පුහුණුවකින් පසුව අදාළ නිලධාරීන් ප්‍රධාන කාර්යාලයේ අදාළ අංශවලට අනුයුක්ත කිරීමට කටයුතු කර ඇත. | බඳවාගැනීමේ පරිපාටිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| | | සැලසුම් අංශයේ සහකාර අධ්‍යක්ෂ තනතුර සඳහා රාජ්‍ය අංශයේ/ සංස්ථා/ මණ්ඩල හෝ පිළිගත් ආයතනයක වසර 03 ක සැලසුම්කරණ හෝ කාර්යඵල මෙහෙයුම් ක්ෂේත්‍රයේ පළපුරුද්ද ඇති නිලධාරියෙකු බඳවාගත යුතු වුවත්, එයට පටහැනිව වසර 03 ක ක්ෂේත්‍ර හා පරිපාලන කටයුතු පිළිබඳ පළපුරුද්ද ඇති නිලධාරියෙකු බඳවාගෙන තිබුණි. | බඳවා ගැනිමේ පරිපාටිය අනුව එක් එක් අංශය සඳහා නම් කොට ඇති සහකාර අධ්‍යක්ෂවරුන් ප්‍රමාණවත් පරිදි බඳවා ගැනීමට අනුමැතිය නොලැබීම හා පුරප්පාඩු වූ තනතුරු සඳහා සුදුසුකම් සහිත අයදුම්කරුවන් ඉදිරිපත් නොවීය. බඳවා ගන්නා ලද අයදුම්කරුවන්ගේ සුදුසුකම් හා අදාල අංශවල සේවය කිරීමට ඔවුන් සතුව පැවති විෂයානුබද්ධ දැනුම පරීක්ෂාකර කෙටි පුහුණුවකින් පසුව අදාළ නිලධාරීන් ප්‍රධාන කාර්යාලයේ අදාළ අංශවලට අනුයුක්ත කිරීමට කටයුතු කර ඇත. | බඳවාගැනීමේ පරිපාටිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | (ii) 5.2.1 (අ) උප වගන්තිය | බාහිර අයදුම්කරුවන්, සිංහල/ දෙමළ භාෂාව සහ ගණිතය ඇතුළුව තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබිය යුතු වුවත්, සුදුසුකම් සපුරා නොතිබුණු නිලධාරින් 12 දෙනෙකු කළමනාකරණ සහකාර තනතුර සඳහා බඳවාගෙන වර්ෂ 03 ක කාලයක් අනියම් නිලධාරීන් ලෙස රඳවා තබාගෙන තිබුණි. | බඳවා ගැනීම සඳහා අනුමැතිය නොලැබී තිබුණු කාල පරිච්ඡේදයේදී පුහුණු පදනමින් නිලධාරීන් බඳවාගෙන මණ්ඩලීය කටයුතු කාර්යක්ෂමව සිදුකර ගෙන යන ලදී. අනියම් පදනම මත කටයුතු කරනු ලබන කළමනාකරණ සහකාර නිලධාරීන්හට ඔවුන්ගේ තනතුරට අවශ්‍ය මූලික සුදුසුකම් සපුරාගන්නා ලෙස පෙළඹවීම් සිදු කර ඇති අතර ඉදිරියේ දී එම නිලධාරීන් අදාළ සුදුසුකම් සපුරා ගැනීමෙන් පසුව කළමනාකරණ සහකාර තනතුරේ ස්ථිර කිරීමට කටයුතු කරනු ලබයි. | සුදුසුකම් සපුරා නොමැති නිලධාරින් අනියම් පදනමට තනතුරු සඳහා බඳවා නොගත යුතුය. |
| (ඇ) | 2022 දෙසැම්බර් 14 දිනැති අංක 2310/29 දරන කාර්ය පටිපාටික රීති සඳහා වන අති විශේෂ ගැසට් පත්‍රයේ IX පරිච්ඡේදයේ 131 වගන්තිය | වැඩ බැලීමේ පත් කිරීමක් කළ යුත්තේ අනුමත කාර්ය මණ්ඩලය තුළ ඇති තනතුරක සේවයේ නියුතු නිත්‍ය රජයේ නිලධරයකු, විධිමත් අනුමැතියක් ලබාගෙන කිසියම් කාලසීමාවක් එම තනතුරෙහි සේවයෙන් බැහැරව සිටින අවස්ථාවක හෝ අනුමත කාර්ය මණ්ඩලය තුළ ඇති තනතුරක පුරප්පාඩුවක් පවත්නා අවස්ථාවක එම තනතුරට ස්ථිර පත් කිරීමක් කරනු ලබන තෙක් තාවකාලික ප්‍රතිකර්මයක් වශයෙන් වන නමුත්, තනතුරු 07 ක් සඳහා නිලධාරින් 26 ක් මාස 08 සිට අවුරුදු 12 දක්වා දීර්ඝ කාලීනව වැඩ බැලීමේ පදනමට සේවයේ යොදවා තිබුණි. | මේ වන විට වැඩ බැලීමේ තනතුරු 02 ක් සඳහා ස්ථිර බඳවා ගැනීම් සිදුකර ඇති අතර අනෙකුත් පුරප්පාඩු තනතුරු සඳහා බඳවා ගැනීමට අනුමැතිය සඳහා යොමුකර ඇත. අනුමැතිය ලැබුණු පසු පුරප්පාඩු තනතුරු සඳහා බඳවා ගැනීම් සිදු කිරීමට කටයුතු කරනු ලැබේ. | ස්ථිර පත් කිරීමක් කරනු ලබන තෙක් තාවකාලික ප්‍රතිකර්මයක් වශයෙන් නමුත්, දීර්ඝ කාලීනව වැඩ බැලීමේ පදනමට සේවයේ නොයෙදිය යුතුය. |
| (ඉ) | 2015 මැයි 25 දිනැති PED අංක 1/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 2 ඡේදය | චක්‍රලේඛයට පටහැනිව MM 1-1 සේවා ශ්‍රේණියට අයත් නිලධාරීන් 19 දෙනෙකු සඳහා 2022 වර්ෂය තුළදී රු.1,380,533 ක් සහ සමාලෝචිත වර්ෂය තුළදී රු.1,837,960 ක් ප්‍රවාහන දීමනා ගෙවා තිබුණි. | පනත ප්‍රකාරව මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම සඳහා තීරණ ගැනීමේ නිසි බලය අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරී ඇත. පනතේ බලතල ප්‍රකාරව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ක්‍රියාත්මක කර ඇති තීරණයකට චක්‍රලේඛයක් මගින් පෙන්වා ඇති කරුණක් අනුගමනය කළ යුතු බව විගණනය මගින් පෙන්වා දී තිබූ බැවින් | චක්‍රලේඛය අනුව ප්‍රවාහන දීමනා හිමි නොවන සේවා ශ්‍රේණියට අයත් නිලධාරීන් සඳහා ප්‍රවාහන දීමනා |

| | | | | |
|---|---|---|---|---|
| | | | අදාළ චක්‍රලේඛය නිකුත් කර ඇති ආයතනයෙන් අනුමැතිය ලබා ගැනීම සඳහා 2019/05/10 දිනැති අංක 3/1/8/1 දරන ලිපිය මඟින් රේඛීය අමාත්‍යාංශයේ ලේකම්වරයාගෙන් ඉල්ලුම් කර ඇත. මේ සම්බන්ධයෙන් තීරණයක් ලබා දෙන තෙක් අධ්‍යක්ෂ මණ්ඩල තීරණය ක්‍රියාත්මක වන අතර, මේ සම්බන්ධයෙන් 2023/03/27 දිනැති අංක 3/1/8/1 දරන ලිපිය මඟින් නැවත රේඛීය අමාත්‍යාංශයේ ලේකම්වරයාගෙන් ඉල්ලීමක් කර ඇති බව දන්වා සිටිමි. | නොගෙවිය යුතුය. |
| (ඊ) | 2022 ඔක්තෝබර් 06 දිනැති හා අංක 06/2022 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | වයස අවුරුදු 60 ඉක්මවා සේවයේ යෙදී සිටින සහ 2022 දෙසැම්බර් 31 දින හෝ එදිනට පෙර වයස අවුරුදු 60 සම්පූර්ණ වන රජය සතු ව්‍යවසායන් හි සේවකයන් 2022 දෙසැම්බර් 31 දිනට හෝ ඊට ප්‍රථම අනිවාර්යයෙන්ම විශ්‍රාම ගත යුතු වුවත් සහ කොන්ත්‍රාත් පදනම මත බඳවාගැනීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමැතියක් ලබා ගත යුතු වුවත් එදිනට වයස අවුරුදු 60 සම්පූර්ණ කරන සහ වයස අවුරුදු 60 ඉක්ම වූ නිලධාරීන් 5 ක් සේවයේ යොදවා අනුමැතියක් නොමැතිව වැටුප් හා දීමනා ලෙස රු.4,389,535 ක් ගෙවීම් කර තිබුණි. | දීර්ඝ කාලයක් තිස්සේ පුරප්පාඩු සම්පූර්ණ නොවීම නිසා සේවක හිඟයක් මණ්ඩලය තුළ පැන නැඟී ඇත. නව ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ බඳවා ගැනීම් ආරම්භ කරමින් දීප ව්‍යාප්තව ප්‍රචලිත කිරීම ආරම්භ කරන ලදී. මණ්ඩලයට දැඩි අවශ්‍යතාවක්ව පැවති ERP පද්ධතිය මණ්ඩලය තුළ ක්‍රියාවට නංවන ලදී. නව පුහුණු මධ්‍යස්ථානය, AIMS ව්‍යාපෘතිය, රක්ෂණ ප්‍රවර්ධන කටයුතු, 4000කට අධික වූ තැපැල් කන්තෝරු, සියළුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල, පශු රක්ෂණ යෝජනා ක්‍රමයට අදාළව සත්ත්ව රක්ෂණය ව්‍යාප්ත කිරීම ආරම්භ කිරීම, නව බඳවා ගැනීමේ පරිපාටිය සහ කාර්යය පරිපාටිය සැකසීම වැනි ව්‍යාපෘති සකස් කර මේ වන විට ක්‍රියාවට නංවමින් පවතී. එබැවින් අදාළ පුරප්පාඩු සම්පූර්ණ කරන තෙක් අත්දැකීම් බහුල මෙම නිලධාරීන්ගේ සේවය ලබා ගැනීමට කටයුතු කරන ලදී. ඒ අනුව කොන්ත්‍රාත් පදනම මත සංවර්ධන නිලධාරීන් හා කළමනාකරණ නිලධාරීන් බඳවා ගැනීම සඳහා 531/18 අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව මඟින් අනුමැතිය ලබා දී ඇත. ඉදිරියේදී අනුමැතිය ලැබුණු පසු නව බඳවා ගැනීම් සිදු කිරීමට කටයුතු කරනු ලැබේ. පසුව අදාළ නිලධාරීන්ගේ සේවය අවසන් කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. | වයස අවුරුදු 60 සම්පූර්ණ සේවකයන් සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමැතියක් ලබා ගත යුතය. |

| | | | | |
|---|---|---|---|---|
| (උ) | 2023 ජනවාරි 18 දිනැති අංක 01/2023 දරන මුදල් ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශ චක්‍රලේඛය | රජයේ මූල්‍ය නොවන වත්කම් ලේඛනගත කිරීම සඳහා 2022 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ පවත්නා ගොඩනැගිලි පිළිබඳව තොරතුරු 2023 වර්ෂයේ මාර්තු 15 දින හෝ එදිනට පෙර කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලය වෙත යවා නොතිබුණි. | මේ වන විට මණ්ඩලය සතුව පවතින තොරතුරු කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලය වෙත යවා ඇති අතර, අනුරාධපුරය, මහියංගනය, ඇඹිලිපිටිය යන දිස්ත්‍රික් කාර්යාල වල අදාළ තක්සේරු වාර්තා ලබා ගැනීම සඳහා කටයුතු කරමින් සිටින අතර, අදාළ නිවැරදි වාර්තා ලබා ගැනීමෙන් පසුව අදාළ තොරතුරු කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලය වෙත යැවීමට කටයුතු කිරීමට අපේක්ෂා කෙරේ. | සියළුම ගොඩනැගිලි පිළිබඳව තොරතුරු කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලය වෙත යැවිය යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මණ්ඩලයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.982,500,036 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.2,440,680,754 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.1,458,180,718 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට වන්දි ගෙවීම වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂයේ සමූහයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.3,884,548,662 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.2,135,968,851 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.1,748,579,811 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට වන්දි ගෙවීම වැඩිවීම සහ ඒ සඳහා මහා භාණ්ඩාගාරයෙන් ලද දායකත්වය අඩු වීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 හඳුනාගත් පාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත ප්‍රකාරව ආදායම් බදු සඳහා ලියාපදිංචි නොවීම හේතුවෙන් 2018 අප්‍රේල් 01 සිට 2023 දෙසැම්බර් 31 දින දක්වා ගෙවිය යුතු බදු මුදල රු.299,354,489 ක් නියමිත දිනයන්හීදී ගෙවා නොතිබීම හේතුවෙන් ප්‍රමාද පොළිය රු.40,869,072 ක පාඩුවක් මණ්ඩලයට දැරීමට සිදු ව තිබුණි. | මණ්ඩලය කෘෂි රක්ෂණ හා සමාජ ආරක්ෂණ කටයුතු සිදු කරන බැවින්, 1979 අංක 28 දරන සහ ඊට පසු ක්‍රියාත්මක වූ 2006 අංක 10 දරන දේශිය ආදායම් පනත් මඟින් මණ්ඩලයේ සියලු ලාභ හා ආදායම්, ආදායම් බද්දෙන් නිදහස් කර තිබුණි. නමුත් 2017 අංක 24 දරන පනත මඟින් නිදහස් කර නොතිබූ නිසා මණ්ඩලයට ආදායම් බදු ගෙවීමට සිදු ව ඇත. ආදායම් බදු ගණනයේදී සාමාන්‍ය සමාගම් සඳහා වන සියයට 30 ක බදු අනුපාත අනුව බදු ගෙවීමට මණ්ඩලයට සිදුව තිබූ අතර දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සමඟ දීර්ඝ වශයෙන් සාකච්ඡා කර මණ්ඩලය විසින් ගෙවිය යුතු බදු ආදායම සියයට 14 ක ප්‍රතිශතය අදාළ කර ගෙවීමට කටයුතු කර ඇත. මේ අනුව මණ්ඩලයට මූල්‍යමය පාඩුවක් සිදු වී නොමැත. මේ අනුව 2024/25 වර්ෂයේ සිට නිවැරදිව බදු බැඳියාව නිරවුල් කිරීමට කටයුතු කරනු ලැබේ. | 2024/25 වර්ෂයේ සිට නිවැරදිව බදු බැඳියාව නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 1999 අංක 20 දරන කෘෂිකාර්මික සහ ගොවිජන රක්ෂණ පනතේ 7(අ) උප වගන්තිය ප්‍රකාරව ගොවීන් 8,185 කට 2017 සහ 2018 වර්ෂවල දී ගෙවන ලද රු.70,800,200 ක වන්දි මුදල්, ගිණුම් අංක, ගොවීන්ගේ නම් හා හැඳුනුම්පත් අංක නොගැලපීම හේතුවෙන් වාණිජ බැංකු මඟින් ආපසු එවා ඇතත් අදාළ ගොවීන් හඳුනාගෙන එම මුදල නිරවුල් කිරීමට හෝ නැවත භාණ්ඩාගාරයට ප්‍රේෂණය කිරීමට වසර 6 ක් තිස්සේ කටයුතු කර නොතිබුණි. | ගෙවීම් ප්‍රතික්ෂේපිත වූ ගොවීන් සඳහා සංශෝධිත ලේඛන සකස් කර එවන ලෙස ගොවිජන සේවා මධ්‍යස්ථාන හා දිස්ත්‍රික් කාර්යාල දැනුවත් කර ඇති අතර, එසේ ලැබුණු සංශෝධිත ලේඛන සඳහා ගෙවා ඇත. වන්දි මුදල් නැවත හිමිකම් නොපෑ ගොවීන්ගේ එකී රු.70,800,200 ක මුදල දිගින් දිගටම ගොවියන් විසින් හිමිකම් නොපෑම නිසා කෘෂි රක්ෂණ අරමුදල වෙත මාරු කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කළ අතර, එම මුදල් කෘෂිකාර්මික දත්ත කළමනාකරණ පද්ධතිය නිර්මාණය කිරීම සඳහා ලබාදීමට අනුමැතිය හිමි වී ඇත. නමුත්, එම මුදල් එකී අරමුණ සඳහා භාවිතා නොකළ බැවින් නැවත අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කර ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට නියමිතය. | ඉදිරිපත් නොවූ වන්දි මුදල් භාණ්ඩාගාරයට ප්‍රේෂණය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2019 සැප්තැම්බර් 02 දිනැති අංක 07/2017 (සංශෝධන II) දරන කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශ චක්‍රලේඛය අනුව තොරතුරු වාර්තා කරන ලද කාර්යාල 17 හි 2021/2022 මහ කන්නයට අදාළව හදිසි අනතුරු රක්ෂණ ආවරණය සඳහා ගොවීන් 23,351 ක ගෙන් රු.9,244,450 ක මුදලක් මණ්ඩලයේ ආදායම ලෙස හඳුනාගෙන තිබුණු නමුත් ඉන් ගොවීන් 15,491 ක් වෙත ඔප්පු ලබාදී නොතිබුණු අතර ගොවීන් 7,851 ක් වෙත ඔප්පු ලබා දී තිබෙනුයේ වසරක රක්ෂිත කාලයෙන් මාස 07 සිට මාස 10 ක කාලයක් ගත වීමෙන් පසුව බව නිරීක්ෂණය විය. | දිස්ත්‍රික් කාර්යාල තුළ පැවති නිලධාරී හිඟය හා නිලධාරීන්ගේ කාර්යබහුලතාවය මේ සඳහා හේතුවී ඇති අතර, ඉදිරියේදී නිකුත් කරනු ලබන වගා රක්ෂණ ඔප්පු සඳහා හදිසි අනතුරු ඔප්පු නිකුත් කිරීමට කටයුතු කරනු ලැබේ. | රක්ෂණ ආවරණය සඳහා බඳවාගත් අවස්ථාවේදීම රක්ෂණ සහතික ලබා දීමට කටයුතු කළ යුතුය |
| (ඇ) | දායකයා වෙත ලබා දී තිබෙන සහතික ඔප්පුවේ 6 වගන්තිය ප්‍රකාරව ගෙවා ඇති අර්ධ වාර්ෂික දායක මුදල් ප්‍රමාණයෙන් සියයට 75 ක් ලැබී තිබේ නම් මණ්ඩලය විසින් තීරණය කරන පරිදි නියමිත විශ්‍රාම වැටුපට වඩා අඩු විශ්‍රාම වැටුපක් ලැබීමට හිමිකම් ඇතත් එසේ සිදු නොකර විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ සම්පූර්ණයෙන් අහිමිකර තිබුණි. | ඕනෑම දායකයෙකු අවලංගු නොවී ගෙවිය යුතු වාරික ප්‍රමාණයෙන් සියයට 75 වඩා ගෙවීම් කර ඇත්නම් ඔහුට අඩුකළ විශ්‍රාම වැටුපක් සකසනු ලබයි. එසේ අඩුකළ විශ්‍රාම වැටුප් සැකසීම සඳහා දායකත්වය අවලංගු නොවී සියයට 75 වඩා වාරික ප්‍රමාණයක් ගෙවා තිබිය යුතුවේ. | අර්ධ වාර්ෂික දායක මුදලින් සියයට 75 ක් ගෙවා ඇති දායකයින් සඳහා විශ්‍රාම වැටුප් ගෙවිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | 1990 අංක 20 දරන කෘෂිකාර්මික සහ ගොවිජන රක්ෂණ පනතෙහි 24 වගන්තියෙහි 4 වගන්තිය ප්‍රකාරව අනපේක්ෂිත සිදුවීම්වලින් පැන නඟින හිමිකම් දැක්වීම් වෙනුවෙන් ගෙවීම් කිරීම සඳහා ස්වකීය අභිමතය පරිදි යොදා ගත යුතු සංචිත අරමුදලක් 2002 වර්ෂයේ සිට ගොඩනඟා ගෙන තිබුණු අතර 2023 දෙසැම්බර් 31 දිනට එහි ශේෂය රු.498,536,253 ක් විය. එම අරමුදල භාවිත කළ යුතු අනපේක්ෂිත සිදුවීම් පිලිබඳව නිර්වචනය කර රීති ගොඩනගාගෙන නොතිබුණු නිසා 2002 වර්ෂයේ සිට මේ දක්වා වසර 21 ක කාලය තුළ මෙම අරමුදල භාවිතා කර නොතිබුණි. | 1999 අංක 20 දරණ කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩල පනතෙහි 24 වන වගන්තිය ප්‍රකාරව "කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ අරමුදල" යනුවෙන් හැඳින්වෙන අරමුදලක් මණ්ඩලය වෙත තිබිය යුතුය යන්න දක්වා ඇත. ඒ අනුව සෑම වර්ෂයකම මෙහෙයුම් ලාභයෙන් සියයට 5 ක ප්‍රතිශතයක් වෙන් කිරීම තුළින් මෙම අරමුදල ගොඩනඟා ඇත. මණ්ඩලය විසින් කෘෂිකාර්මිකයින්ගේ දායකත්වය සහිතව ආරම්භ කිරීමට අපේක්ෂා කරන ජීවිත රක්ෂණ යෝජනා ක්‍රමය ඇතුළු අනෙකුත් රක්ෂණ යෝජනාක්‍රම සඳහා පැන නඟින මූලික ප්‍රාග්ධන හා අතිරේක ප්‍රාග්ධන අවශ්‍යතා (ආයු ගණක තක්සේරු වාර්තා ලබා ගැනීමෙන් පසුව පැන නඟින අවශ්‍යතා) සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගැනීමෙන් පසුව මෙම අරමුදල භාවිතා කිරීමට අපේක්ෂා කෙරේ. | අරමුදල ආරම්භ කිරීමේ අවශ්‍යතාවය හා භාවිතය පිළිබඳව අවධානය යොමු කළ යුතුය. |
| (ඉ) | තුන්වන පාර්ශවයේ රථවාහන රක්ෂණ යෝජනා ක්‍රමය යටතේ එක් එක් නියෝජිතයාට ලබා දී ඇති තාවකාලික ආවරණපත්‍ර ප්‍රමාණය,අලෙවි කර ඇති ප්‍රමාණය, අවලංගු කරන තාවකාලික ආවරණ පත් ප්‍රමාණය හා මාසික අලෙවි ආදායම තහවුරු කර ගැනීමටත් ,තාවකාලික ආවරණ අංක අනුපිළිවෙලින් ඒ මත උපයා ඇති ආදායම බැංකු ගිණුමට තැන්පත් වී ඇති බවට සහතික කර ගැනීමටත් හා එක් එක් නියෝජිතයා විසින් කර ඇති තැන්පතු බැංකු ප්‍රකාශය මගින් වෙන්කර හඳුනාගැනීමටත් හැකිවන පරිදි නිවැරදිව සහ සම්පූර්ණව තොරතුරු පවත්වාගෙන ගොස් නොතිබුණු අතර බැංකු ගතකළ ආදායමේ සම්පූර්ණත්වය ඉහළ නිලධාරියකුගේ අධීක්ෂණයට ලක්නොවන බවත් නිරීක්ෂණය විය. | තෙවන පාර්ශවීය රක්ෂණ කටයුතු සිදු කරගෙන යාම සඳහා දිස්ත්‍රික් කාර්යාල විසින් මේ වන විට Access යෙදවුම් පද්ධතිය යොදා ගෙන දත්ත පද්ධතිය පවත්වාගෙන යනු ලබයි. මෙම පද්ධතිය තුළ විශ්ලේෂණය කිරීම තුළින් අදාළ තොරතුරු ලබා ගත හැකි අතර, දත්ත පද්ධතිය වෙත අදාළ තොරතුරු නිවැරදිව ඇතුළත් කරන ලෙස දිස්ත්‍රික් කාර්යාල නිලධාරීන් දැනුවත් කර ඇති බව පෙන්වා දෙමි. මණ්ඩලය විසින් දිස්ත්‍රික් කාර්යාල කිහිපයක තෙවන පාර්ශවීය රක්ෂණ කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා ERP පද්ධතිය හඳුන්වා දී ඇති අතර, මෙම දත්ත පද්ධතිය භාවිතයෙන් අදාළ තොරතුරු නිවැරදිව ලබා ගැනීමේ හැකියාව පවතින බව පෙන්වා දෙමි. | ආදායම් හා තොරතුරු සම්පූර්ණ ලෙස පැවැත්විය යුතුය. |

**3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ සහය ඇතිව වගාහානි සඳහා මාස 2ක් ඇතුළත වන්දි මුදල් ගෙවිය යුතු වුවත් 2023 මාර්තු මාසයෙන් අවසන් වන 2022/2023 මහ කන්නය සඳහා නිර්දේශ වී ලැබුණු අයදුම්පත් 39,455 ක් වෙනුවෙන් රු.914,574,064 ක් 2023 ජුනි 09 දින ආරම්භ කර 2024 සැප්තැම්බර් 02 දින දක්වා ගෙවීම් කර තිබුණි. | පවතින ප්‍රායෝගික තත්ත්වයන් මත හා නිලධාරීන්ගේ කාර්යබහුලතාවය මත මෙවැනි ප්‍රමාදයන් සිදුවන අතර, ගොවිජන සේවා මධ්‍යස්ථාන සංවර්ධන නිලධාරීන් සමඟ සාකච්ඡා කර අදාළ ප්‍රමාදයන් අවම කර ගැනීමට කටයුතු කරන බව පෙන්වා දෙමි. | වන්දි ගෙවීමේ ප්‍රමාදයන් අවම කර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 1987 අංක 12 දරන ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනාක්‍රම පනතෙහි 6(1) වගන්තිය ප්‍රකාරව, යොජනා ක්‍රමයට දායකව විශ්‍රාම වැටුප් ලැබීමට හිමිකම ඇති වයස අවුරුදු 60 සම්පූර්ණ වූ ගොවීන් හඳුනා ගෙන විශ්‍රාම වැටුප් නොගෙවීම,15(1) වගන්තිය ප්‍රකාරව පිළිවෙලින් වාරික 5 ක් ගෙවීම පැහැර හැර ඇති බව දායකයෙකුට නොදැන්වීම සහ ප්‍රතිලාභී පාර්ශවය විසින් පිළිවෙලින් වාරික 5 ක් ගෙවීම පැහැර හරිනු නොලබන නමුත් කඩින් කඩ හෝ වාරික 5 ක් නොගෙවූ ප්‍රතිලාභීන් ද ඔප්පුව කඩකළා සේ සලකා විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ අහිමි කිරීම කර තිබුණි. | අවුරුදු 60 සම්පූර්ණ වූ විශ්‍රාම වැටුප්ලාභීන්ගේ අයදුම්පත් හා අදාළ සියලු ලේඛන නිවැරදිව ප්‍රධාන කාර්යාලය වෙත කඩිනමින් යොමු කරන මෙන් සියළුම දිස්ත්‍රික් කාර්යාල දැනුවත් කර ඇත. වයස අවුරුදු 60 සම්පූර්ණ වී මෙතෙක් ගොවි විශ්‍රාම වැටුප් ලබා නොගත් ගොවීන් මේ වන විට දැනුවත් කර ඇත. ගොවි විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රම පනතේ 15(1) වගන්තිය ප්‍රකාරව වාරික 5 ක් ගෙවීම පැහැර හැර ඇති ගොවි මහතුන්ගේ ප්‍රතිලාභයන් අහිමි වනු ඇත. වාරික ගෙවීමේදී සලකා බලනු ලබන්නේ ඔහු ගෙවනු ලබන වාරිකය කවදා ගෙවිය යුතු වාරිකයක්ද යන්නයි. ඒ අනුව කිසියම් වාරිකයක් කන්න 5 ට වඩා එනම් වසර 2 ½ කට වඩා ප්‍රමාද වුවහොත් ඔහුගේ සහතික ඔප්පුවේ සඳහන් ප්‍රතිලාභ අහිමි වනු ඇත. | වයස අවුරුදු 60 සම්පූර්ණ වන විටම විශ්‍රාම වැටුප් ගෙවීමට කටයුතු කළ යුතු අතර වාරික නිසි පරිදි අය වන බව මණ්ඩලය විසින් මාසිකව තහවුරු කර ගත යුතුය |
| (ඇ) | ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය තුළ ලියාපදිංචි 871,425 ක්වූ ගොවීන්ගෙන් 2023 දෙසැම්බර් 31 දිනට අවුරුදු 61 සිට අවුරුදු 93 දක්වා වයස් ගතවූ ගොවීන් 474,803 ක් වුවත් ඉන් 264,227 දෙනෙකුට විශ්‍රාම වැටුප් ගෙවා නොතිබුණි. | වයස අවුරුදු 60 සම්පූර්ණ වී මෙතෙක් ගොවි විශ්‍රාම වැටුප් ලබා නොගත් ගොවීන් මේ වන විට දැනුවත් කර ඇති අතර, සියළුම දිස්ත්‍රික් කාර්යාල සහකාර අධ්‍යක්ෂවරුන් මෙම කටයුත්ත ප්‍රමුඛ කාර්යයක් සේ සලකා කටයුතු කර ඇත. | වයස අවුරුදු 60 සම්පූර්ණ වන විටම විශ්‍රාම වැටුප් ගෙවීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | 1990 අංක 23 දරන ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනාක්‍රම පනතේ 5 (1) වගන්තිය ප්‍රකාරව වයස අවුරුදු 18 සහ 59 අතර ධීවරයෙකුට මෙම යෝජනා ක්‍රමයට බැඳීමට හිමිකම් ඇතත් 2018 වර්ෂයෙන් පසු සාමාජිකයන් බඳවා නොගැනීම, පනතේ 7 වන වගන්තිය ප්‍රකාරව යෝජනා ක්‍රමයට දායක වී සිටින ධීවරයින් සඳහා වයස අවුරුදු 60 සම්පූර්ණ වන විටම විශ්‍රාම වැටුප් ප්‍රදානය නොකිරීම නිසා 2007 ජනවාරි සිට 2016 දෙසැම්බර් දක්වා කාලයට අදාළව ධීවරයන් 139 ක් සඳහා රු.4,159,063 ක් සහ 2022 සහ 2023 වර්ෂවලට අදාළව ධීවරයින් 45 ක් සඳහා රු.1,378,518 ක් ලෙස එකතුව රු.5,537,581 ක් හිඟ විශ්‍රාම වැටුප් ලෙස මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදනය කර තිබුණු නමුත් ධීවරයන් වෙත ගෙවීමට කටයුතු කර නොතිබුණි. | ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය මේ වන විට මූල්‍ය ශක්‍යතාවයක් සහිතව ක්‍රියාත්මක කිරීමට කටයුතු සම්පාදනය කර ඇත. එම කටයුතු පරිගණකගත පරිසරයක් තුළ සිදුකිරීම සඳහා මේ වන විට පූර්ණ පරිගණක දත්ත පද්ධතියක් සකස් කරමින් පවතී. ඒ අනුව මෙම යෝජනා ක්‍රමය සඳහා ධීවරයින් ආකර්ශණය කරගැනීමට 2024 වර්ෂය තුළදී ධීවර අමාත්‍යාංශය සමග ඒකාබද්ධව නව ධීවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයක් හඳුන්වාදීමට අවශ්‍ය පියවර ගනිමින් පවතී. වයස අවුරුදු 60 සම්පූර්ණ වන දායකයින්ගේ ලැයිස්තු දිස්ත්‍රික් කාර්යාල මට්ටමින් ලබාගෙන ඒ ඒ දිස්ත්‍රික් කාර්යාල වෙත යවා ඇති අතර, එම ලැයිස්තු පදනම් කරගෙන විශ්‍රාම වැටුප් හිමි ධීවරයින්ව දැනුවත් කිරීමේ වැඩසටහනක් ආරම්භ කර ඇත. ධීවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට අදාළ | වයස අවුරුදු 60 සම්පූර්ණ වන විට විශ්‍රාම වැටුප් ප්‍රදානය කිරීමට අවශ්‍ය කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | මෙහෙයුම් කටයුතු ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව මගින් සිදුකරන බැවින් මෙම තත්ත්වය එම දෙපාර්තමේන්තුව වෙත දැනුම්දීමට කටයුතු කර ඇත. තවද, දිස්ත්‍රික් ධීවර කාර්යාල මගින් සිදුකරන දැනුවත් කිරීම් වලට අමතරව පුවත්පත් දැන්වීමක් මගින් ධීවර ජනතාව දැනුවත් කිරීමට අවශ්‍ය කටයුතු කරනු ලැබේ. | |
| (ඉ) | යෝජනා ක්‍රමයට දායක වී සිටින ධීවරයින් සංඛ්‍යාව 64,117 ක් වූ අතර ධීවරයින්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වයස අවුරුදු 60 ඉක්මවා විශ්‍රාම වයසට පැමිණ සිටි 31,146 ක් වූ ධීවර දායකයින්ගෙන් 24,187 ක් (එකවර දායක මුදල් ගෙවා දායකත්වය ලබාගත් දායකයින් 5,549 ක් ඇතුළුව) වෙත ධීවර විශ්‍රාම වැටුප් ප්‍රතිලාභය ප්‍රදානය කර නොතිබුණි. | ප්‍රමාද වී ලැබී ඇති අයදුම්පත් සඳහා ප්‍රමාදවීමට හේතුවූ කරුණු දන්වන තුරු හිඟ විශ්‍රාම වැටුප් ගෙවීම සිදුනොකරන ලදී. මේ වන විට හිඟ විශ්‍රාම වැටුප් සහිතව විශ්‍රාම වැටුප් ගෙවීම සිදුකරනු ලබයි. | වයස අවුරුදු 60 සම්පූර්ණ වන විටම විශ්‍රාම වැටුප් ගෙවීමට කටයුතු කළ යුතුය |

**3.4 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ජාත්‍යන්තර මූල්‍ය සංස්ථාව (IFC) සමඟ ඒකාබද්ධව කෘෂිකාර්මික කළමනාකරණ තොරතුරු පද්ධතිය ගොඩනැගීම සඳහා එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානයෙන් 2022 වර්ෂයේදී රු.20,391,089 ක මුදලක් මණ්ඩලය වෙත ලබාදී තිබුණු අතර එම වර්ෂයේදි ඒ සඳහා රු.23,009,698 ක් වැයකර තිබුණද 2024 වර්ෂය වන විටත් වන්දි ගණනය කිරීම සහ වන්දි ගෙවීමේ ක්‍රියාවලිය සඳහා තොරතුරු පද්ධතිය භාවිතා කර නොතිබුණි. | කෘෂිකාර්මික කළමනාකරණ තොරතුරු පද්ධතිය කෘෂිකර්ම අමාත්‍යාංශයේ මූලිකත්වයෙන් සිදුකරනු ලබන අතර, අදාළ වියදම් කෘෂිකර්ම අමාත්‍යාංශය හරහා ප්‍රතිපූරණය කරනු ලබයි. ඊට අදාළ සියලුම ගනුදෙනු නිවැරදිව ගිණුම්ගත කර ඇති අතර, ගිණුම් සටහන් මගින්ද අනාවරණය කර ඇත. | කෘෂිකාර්මික කළමනාකරණ තොරතුරු පද්ධතිය පිහිටුවීමේ අරමුණු ඉටු කරගත යුතුය. |

**3.5 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රු.79,000,000 ක වටිනාකමකට ගිවිසුම්ගත වූ, මණ්ඩලයේ කළමනාකරණ තොරතුරු පද්ධතිය සඳහා ව්‍යවසාය සම්පත් සැලසුම් පද්ධති(ERP) System හා දෘඩාංග මිලදී ගැනීමේ කටයුතු 2023 මාර්තු 01 දින ආරම්භ කර 2023 අගෝස්තු 20 දින වන විට අවසන් කළ යුතු වුවත් 2024 ජූලි 31 දින වන විටත් එම කටයුතු අවසන් කර නොතිබුණි. | ගිවිසුම් කාලය දීර්ඝ කර ගැනීමට මේ වන විට කටයුතු සිදු කර ඇත. | ගිවිසුම් පරිදි කාර්යයන් ඉටු කර ගත යුතුය. |